රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2018.08.08

ප්‍රවෘත්ති නිවේදනය

## සාමයේ සංහිඳියාව හා සංවර්ධනය ජනගත කිරීමේ ජාතික වැඩසටහන "අහන්න" අද (2018.08.08) දෙහිවලින් හා කඩවතින් ඇරඹේ

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ජාතික සංහිඳියාව පිළිබඳ කාර්යාංශය හා එක්ව ජාතීන් අතර සමඟිය, සංහිඳියාව හා අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කරමින් රටේ ජාතික සංවර්ධනය උදෙසා සමස්ත පුරවැසියන් දායක කර ගැනීම ඉලක්ක කර ගත් "අහන්න" - සාමය, සංහිඳියා හා සංවර්ධනය ජාතික වැඩසටහන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මහතාගේ උපදෙස් මත කොළඹ දිස්ත්‍රික්කයේ කඩවත හා දෙහිවල ප්‍රදේශවලදී ආරම්භ වන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි පිහිටුවා ඇති ප්‍රජා පොලිස් ඒකක සම්බන්ධ කර ගෙන, ග්‍රාමීය මට්ටමින් ජනතාව අතර ජාතික සංහිඳියාව සාමය හා සංවර්ධනය ඉලක්ක කර ගත් සංවාද වැඩසටහනක් පැවැත්වේ. මෙම සංවාද වැඩසටහන සඳහා ප්‍රජා නායකයින් සිවිල් පුරවැසියන් හා විද්වත් මණ්ඩලයක් සහභාගි වන අතර මෙම කණ්ඩායම විසින් ප්‍රජාවේ ප්‍රශ්න හා ගැටලු හඳුනා ගනිමින් සමකාමී ප්‍රජාවක් ගොඩනැගීමට අවශ්‍ය ආකල්පමය දිරිමත් කිරීමක් ලබාදෙමින් ජනතාව උනන්දු කිරීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරෙන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

සාකච්ඡා හා සංවාද වැඩසටහනකින් ආරම්භ කෙරෙන "අහන්න" වැඩසටහනේ සෞන්දර්යාත්මක ආකෘතියක් මත විනාඩි 8කට නොඅඩු නාට්‍යමය ජවනිකාවක් හා තේමා ගීතයක් ද ඇතුළත් කර ඇති අතර ජාතික සංහිඳියාව උදෙසා එම ශ්‍රී ලාංකික ජාතියක් පිළිබඳ පිළිබිඹු වන වාර්තාමය වැඩසටහන් ද ඇතුළත් කර තිබෙන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

"අහන්න" වැඩසටහන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යයක් ම ඉලක්ක කර ගෙන පැවැත්වෙන අතර මෙම එක් වැඩසටහනක් මඟින් 300කට නොඅඩු ජනතාවක් ආමන්ත්‍රණය කිරීම අපේක්ෂා කෙරේ. ජාතික තරුණ සේවා සභා, යෞවන සාමාජ, ප්‍රජා පොලිස් ඒකක, ගම් මට්ටමින් ප්‍රජා වැඩසටහන් සඳහා සහභාගි වන විවිධ ප්‍රජා සංවිධානවල සාමාජිකයන් ද එක් කර ගැනීමට කටයුතු කර ඇති බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

මෙහි ආරම්භක වැඩසටහන් දෙහිවල එස්.ඩී.එස්. ජයසිංහ පාසල් ක්‍රීඩාංගනයෙන් ආරම්භ වන අතර ඊට සමගාමීව කඩවත නගරයේ දළුපිටිය සුවතා මංතීරුවේ දී අද (2018.08.08) පස්වරු 4.30ට පැවැත්වෙන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වැඩිදුරටත් පවසයි.

ඩබ්. එම්. ශාන්තප්‍රිය
අංශ ප්‍රධානි (ප්‍රචාරක)
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට